# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2018.08.24 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

**01. <u>පූර්ණකාලීන උපශාලාධිපති (II ශ්‍රේණිය) - කාන්තා</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.34,548.00 (මාසික) වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.2,140.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු. 42,885 - 18x660 - 54,765 [U-MN 3(II)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**02. <u>පරිපාලක - භූමිදර්ශක (පහළ ශ්‍රේණිය) තනතුර</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(අ) (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත් වීම.

සහ

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ ඊට සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන එක් අවුරුදු ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම.

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සහ/හෝ උද්භිද උද්‍යානයක භූමිදර්ශන කටයුතු පිළිබඳ වසර 10 ක අත්දැකීම් ලබා ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු අයෙකු වීම.

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.25,589.00 (මාසික) වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.4,253.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 - මාසික [U-MT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**03. <u>ඖෂධවේදී (පහළ ශ්‍රේණිය) තනතුර</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(i) සුදුසුකම් ලත් ඖෂධවේදියකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.25,589.00 (මාසික) වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.4,253.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 - මාසික [U-MT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

***සැ.යු. අංක 01 - 03 දක්වා තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

**04.** **<u>වඩු කාර්මික (II ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම් :**

(i) 8 ශ්‍රේණිය සමත් වීම.

(ii) පහත කරුණු පිළිබඳ හැකියාව

(අ) ගොඩනැගිලි හා ගෘහභාණ්ඩ තැනීමේ කර්මාන්තයෙහි උපයෝගී කරගනු ලබන පිරිද්දුම් පිළිබඳ දැනීම හා ඒවා සකස් කිරීම පිළිබඳ දැනීම.

(ආ) නොයෙක් අන්දමේ වඩුවැඩ සඳහා ආයුධ පාවිච්චිය පිළිබඳ දැනීම. විවිධ දැව වර්ග පිළිබඳ දැනීම හා වඩුවැඩ කර්මාන්තයට අයත් සැළසුම් කියවීම පිළිබඳ දැනීම.

(ඇ) අඟලෙන් 1/32 පරිමාණයන් නිවැරදිව කියවීම.

(iii) වඩු කර්මාන්තය පිළිබඳ අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.24,209.00 (මාසික) වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.4,571.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00 - මාසික [U-PL 3(III)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**05.** **<u>උද්‍යානකරු (II ශ්‍රේණිය) තනතුර</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(i) 8 ශ්‍රේණිය සමත් වීම.

(ii) ගෙවතු වගාව පිළිබඳ රාජකීය උද්භිත උද්‍යානය, පේරාදෙනිය උද්භිත උද්‍යානය, හග්ගල උද්භිත උද්‍යානය හෝ ගම්පහ උද්භිත උද්‍යානයෙන් ලබාගන්නා ලද වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්ද.

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.21,875.00 (මාසික) වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.5,148.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු.27,025 - 15×250 - 30,775.00 - මාසික [U-PL I(III)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**06.** **පින්තාරුකරු (II ශ්‍රේණිය)**

**අවශ්‍ය සුදුසුකම්:**

(i) 8 ශ්‍රේණිය සමත් වීම.

(ii) පහත සඳහන් අංශවල පළපුරුද්ද සහ නිපුණතාවය ලබා තිබිය යුතුය.

(අ) ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව සම්බන්ධ පින්තාරු වැඩ

(ආ) ප්‍රසිද්ධ සහ සාමාන්‍ය භාවිතයට ගැනීමට සුදුසු සියළුම තීන්ත වර්ග, සියලුම තත්ත්වයන්හි උපකරණ, විවිධ ආකාරයේ පෘෂ්ඨයන් සූදානම් කිරීම සහ සම්පූර්ණ නිමාව ලබා ගැනීම දක්වා පසු කළ යුතු නොයෙක් අවස්ථා සඳහා තෝරාගත් ද්‍රව්‍ය නිවැරදි ලෙස ආලේප කිරීම.

(ඇ) විවිධ වර්ගවල මිනුම් සූදානම් කර ගැනීම මෙන්ම තීන්ත සහ පින්තාරු උපකරණ නිවැරදි ලෙස ගබඩා කිරීම.

(ඈ) මෙවලම් භාවිතය සහ ඒවා අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කිරීම.

(iii) රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/පිළිගත් ආයතනයක පින්තාරු කිරීම සම්බන්ධ වසර දෙකකට නොඅඩු පළපුරුද්ද

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.22,683.00 මාසික වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.4,938.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු. 28,025 - 16×270 - 32,345 [U-PL 2(III)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**07.** **යන්ත්‍ර ශිල්පී (II ශ්‍රේණිය) (Machinist - Grade II)**

**අවශ්‍ය සුදුසුකම්:**

(i) 8 වන ශ්‍රේණිය සමත් වීම.

(ii) පහත දැක්වෙන කරුණු පිළිබඳ හැකියාව තිබිය යුතුය.

(අ) අඟලෙන් 1/64 නිවැරදිව කියවීමේ හැකියාව සහ මයික්‍රොමීටරය සකස් කිරීමේ හැකියාව.

(ආ) මෙම වෘත්තියට අදාළ මෙවලම් සම්බන්ධ කරන කරන උපකරණවල නම් ඒවායේ භාවිතය සහ නඩත්තු කිරීමේ හැකියාව.

(ඇ) රාජකාරියට අදාළ සියළුම සැකසුම් කියවීමේ හා අවබෝධ කර ගැනීමේ හැකියාව.
(ඈ) වැද්දුම් පට්ටලය, හැඩගාන යන්ත්‍රය, නිමයුම් යන්ත්‍ර, ලියවන පට්ටලය යන්ත්‍ර ආදී ක්ෂේත්‍රයන්ගේ යන්ත්‍ර ඉතා කාර්යක්ෂමව ක්‍රියා කරවීමේ හැකියාව.

(iii) පිළිගත් කර්මාන්තශාලාවක වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:**

2018 වර්ෂය තුළ සිදු කරනු ලබන පත්කිරීම් සඳහා රු.24,209.00 මාසික වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, රු.4,571.00 ක මාසික ගැලපීමේ දීමනාවක් ගෙවනු ලැබේ. 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00 - මාසික [U-PL 3(III)] මාසික වැටුප් පරිමාණය හිමි වේ.

*සැ.යු. අංක 04 - 07 දක්වා තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.*

**වෙනත් කරුණු:**

- වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)
- ඉහත මාසික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.
- විශ්වවිද්‍යාල සේවකයින් සිය මාසික මූලික වැටුපෙන් 10% කින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් 15% කට සමාන මුදලක් (8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප සඳහා ද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද බැර කෙරේ. විශ්වවිද්‍යාල පද්ධතියෙහි පත්වීම් දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම යාමේ දිනය දක්වා, එනම් වයස අවු. 60 දක්වා වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට නොහැකි වන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට දායක නොවන අතර, එම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකත්වය ද නොදරයි.) දායක කරනු ලැබේ.තවද ආයතනය විසින් මූලික වැටුපෙන් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා බැර කරනු ලැබේ.

**අයදුම්පත් නිකුත් කිරීම සහ භාර ගැනීම:**

අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ ආයතන අනධ්‍යයන අංශයට පැමිණ හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් (www.ruh.ac.lk) නියමිත ආකෘති පත්‍රය හා බඳවා ගැනීම් පරිපාටියට අදාළ තොරතුරු ලබාගත හැකිය. 2018.08.17 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘතිය භාවිතා කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ ඉහත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා නොතිබීම හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බැලීමට අවකාශ නොමැත.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම,
මාතර.
2018.07.31